# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

**07 ශ්‍රේණිය** | **විද්‍යාව** | **ඒකකය 2 - ස්ථිති විද්‍යුතය**

## A කොටස

**සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) සේද රෙදි වලින් පිරිමදින ලද වීදුරු දණ්ඩක් අසලට තවත් එවැනිම ආරෝපිත වීදුරු දණ්ඩක් ලංකළ විට,
1) ආකර්ෂණය වේ. 2) විකර්ෂණය වේ.
3) ආකර්ෂණය හෝ විකර්ෂණය නොවේ. 4) මුලින් විකර්ෂණය වී පසුව ආකර්ෂණය වේ.

02) ස්ථිති විද්‍යුත් ආරෝපණ ගබඩාකළ හැකි උපකරණය වන්නේ,,
1) වියළිකෝෂය 2) සූර්ය කෝෂය 3) ධාරිත්‍රක 4) ඩයිනමෝව

03) ස්ථිති විද්‍යුත් ආරෝපණ ප්‍රමාණය මනින ඒකකය වන්නේ,
1) ෆැරඩ් 2) කූලෝම් 3) ඇම්පියර් 4) ඕම්

04) විසර්ජනය වූ ධාරිත්‍රකයක් නැවත ආරෝපණය කිරීම සඳහා භාවිතා කළ හැකි උපාංගය වන්නේ,
1) ආලෝක විමෝචක ඩයෝඩය 2) සරල කෝෂය
3) ගැල්වනෝමීටරය 4) වියළි කෝෂය

05) පිරිමැදීමේදී ද්‍රව්‍ය මතුපිට විද්‍යුත් ආරෝපණ ඇතිවන බව ප්‍රථම වරට පෙන්වා දුන්නේ,
1) බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් 2) තෝමස් අල්වා එඩිසන්
3) විලියම් ගිල්බර්ට් 4) සර් අයිසෙක් නිව්ටන්

06) ස්ථිති විද්‍යුත් ආරෝපණ හඳුනාගත හැකි උපකරණය වන්නේ,
1) ස්වර්ණපත්‍ර විද්‍යුත් දර්ශකය 2) ධාරිත්‍රකය 3) ගැල්වනෝමීටරය 4) වියළිකෝෂය

## B කොටස

♣ **වරහන තුළින් සුදුසු වචනය තෝරාගෙන ඡේදයේ හිස්තැන් පුරවන්න.**

1) පිරිමැදීම නිසා ද්‍රව්‍ය මතුපිට හටගන්නා ආරෝපණ ................................................................ ලෙස හැඳින්වේ. වියළි හිසකෙස් ප්ලාස්ටික් පනාවකින් පිරිමදින විට හිසකෙස් වලින් ඍණ ආරෝපිත අංශු වන ............................................ ප්ලාස්ටික් පනාව මතුපිට එකතුවේ. එවිට පනාව ................................ ලෙසද, හිසකෙස් ....................... ලෙසද ආරෝපණය වේ. මෙලෙස ආරෝපණය වූ වස්තු වෙතට ...................................... ද්‍රව්‍ය ............................................. වේ. සමාන ලෙස ආරෝපණය වූ වස්තු එකිනෙක ...................................... කරයි. ............................................ ලෙස ආරෝපණය වූ වස්තු එකිනෙක ආකර්ෂණය කරයි. ධන හා ඍණ ලෙස ............................................ වස්තු එකිනෙක ස්පර්ශ වූ විට ඇතිවන ප්‍රතිවිරුද්ධ ආරෝපණ නිසා එම වස්තු ............................................ වේ.

(ආරෝපිත, අසමාන, ආකර්ෂණය, ඉලෙක්ට්‍රෝන, විකර්ෂණය, උදාසීන, ඍණ, සැහැල්ලු, ධන, ස්ථිති විද්‍යුත් ආරෝපණ)

## C කොටස

1) i) ධාරිත්‍රකයක සම්මත සංකේතය ඇඳ දක්වන්න.

ii) විද්‍යාගාරයේදී සරල ධාරිත්‍රකයක් තනා ගැනීමට අවශ්‍ය වන ද්‍රව්‍ය 2 ක් නම් කරන්න.

iii) ධාරිත්‍රකයක් විසර්ජනය වීම යනු කුමක්ද ?

iv) ධාරිත්‍රකයක් ආරෝපණය වීම සඳහා සුදුසු පරිපථ සටහනක් ඇඳ දක්වන්න.

v) රූප සටහනෙහි දක්වා ඇති ආකාරයට පරිපථය සැකසූ විට ගැල්වනෝමීටර කටුව උත්ක්‍රමණය වනු නිරීක්ෂණය විය. එයට හේතුව පැහැදිලි කරන්න.




2) සේද රෙදි කැබැල්ලකින් පිරිමදින ලද බීම බටයක් බිත්තියක් මත ඇලී තිබෙන අයුරු රූපයේ දැක්වේ.




i) බිත්තිය මත හටගෙන ඇත්තේ කුමන වර්ගයේ ආරෝපණයක්ද ?

ii) එබනයිට් දණ්ඩක් ලෝම රෙද්දකින් පිරිමැදි විට එබනයිට් දණ්ඩට ලැබෙන ආරෝපණය කුමක්ද ?

iii) ඉහත ආකාරයට ආරෝපිත එබනයිට් දණ්ඩක් අසලට + ලෙස ආරෝපිත බීම බටය ලංකළ විට කුමක් සිදුවේද ?

iv) ස්ථිති විද්‍යුත් ආරෝපණ ප්‍රයෝජනයට ගන්නා අවස්ථා 2 ක් ලියන්න.

සැකසුම - කේ. වී. සී. ප්‍රියදර්ශනී මිය